# ප්‍රශංසා එකතු සුපුවත

## 2018 නොවැම්බර් මස 05 වන දින සිට නොවැම්බර් මස 11 වන දින දක්වා

## "සාන්තුවරයන්ගේ සමෝස ධර්මලාභය"

01. ප්‍රශංසාවට හැඳින්වීම :

* ශුද්ධවූ ත්‍රිත්වයක වූ දෙවියන් වහන්සේට නමස්කාර කරමු : එක් අයෙක් මුළින් ' ... අපි නමස්කාර කරමු' යයි ප්‍රකාශ කිරීමෙන් පසු දෙවනුව සහභාගි වන ජනතාව ' .... මම නමස්කාර කරමි ' යයි ප්‍රකාශ කිරීම කරන්න.
* පුබුදු ගී අංක 10 'ශුද්ධාත්මයාණෙනි වඩිනු මැනේ ' (ගීය ගායනා කිරීමට පෙර ගීතිකාවේ අන්තර්ගත වචන වලට අවධානය යොමු කරවමින්, විනාඩි ස්වල්පයක් තුළ ඒ ගැන මෙනෙහි කිරීමකට යොමු කරන්න.
* ඉන්පසු ශුද්ධාත්මයාණන් තුළ ප්‍රශංසාවට, යාච්ඤාවට, ජනතාවට ඇරයුම් කරමින් ගීතය ගායනයත් සමඟ ප්‍රශංසාවට පිවිසෙන්න.
* පුබුදු ගී අංක 377 'සුදත් බලයෙන් පිරෙමු දැන් ' ගීය පද කිහිපයක් කොටස් ලෙස ගායනා කරමින් ශුද්ධාත්ම ගායනයට, අන්‍ය භාෂාවෙන් ප්‍රශංසාවට, ශුද්ධාත්ම ඵල-රස ශුද්ධාත්ම දීමනා අත්දකින්නට යොමු කරන්න. අප, අපගේ යාච්ඤාව හා ප්‍රශංසාව තුළ'ස්වර්ගීය අත්දැකීමෙන් බිඳක් ' අත්දකිමු.

02. පසුගිය ඔක්තෝබර් පළමුවෙනි ඉරිදා සාංඝික පවුල් දිනයේ ලැබූ, සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගැනීම ....

* සංඝ දින සුපුවත ගැන කෙටි මතක් කිරීමක් කරන්න. (වචනයේ සේවකයා)

03. දවසේ සුපුවත :

* 1 තෙසලෝනික 4 : 13-18 දක්වා කොටස පොදුවේ ප්‍රකාශ කරන්න. අප ගත කරමින් සිටින නොවැම්බර් මාසය "සග සැපත් අය සිහිකරන මාසය" ලෙස හඳුන්වමු.

* කුඩා සංඝ ලෙස වෙන්වී නැවත මෙම පාඨය කියවා මේ පිළිබඳව සාංඝික කර ගනිමු.

* ඉන්පසු කුඩා සංඝ කිහිපයක අත්දැකීම් පොදුවේ සාඝික කර ගනිමු.

04. "සාන්තුවරයන්ගේ සමෝස ධර්ම ලාභය" :

i "කතෝලික සභා ධර්මෝපදේශය" ග්‍රන්ථයෙන් උපුටාගත් පහත දැක්වෙන කරුණු වෙත අවධානය යොමු කරවන්න.

* "අපෙන් කිසිවෙකු තමාම උදෙසා ජීවත් වන්නේවත්, තමාම උදෙසා නසින්නේවත් නැත" (රෝම 14:7) "මෙසේ එක අවයවයක් වේදනා විඳී නම් ඒ සමඟ සියලුම අවයවයෝ වේදනා විඳිති. එලෙසම එකම අවයවයක් ගෞරවය ලබයි නම්, ඒ සමඟ සියලුම අවයවයෝ ප්‍රීති වෙති. එහෙයින් ඔබ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ද වෙන් වෙන් වශයෙන් එහි අවයවයෝ ද වන්නාහුය." (1 කොරින්ති 12:26-27)
* "ප්‍රේමය ආත්මාර්ථකාමී නොවේ" (1 කොරින්ති 13:5) සාන්තුවරයන්ගේ සාමුහිකත්වය මත පදනම් වූ, ජීවමාන හෝ මියගිය සියල්ලන් සමඟ ඇති මෙම සාමුහිකත්වය තුළ ප්‍රේමය පෙරදැරිව අප කරන ඉතා සුළු ක්‍රියාවක් වුව ද සියල්ලන්ගේ ප්‍රයෝජනය පිණිස හේතු වන්නේය. සෑම පාපයක්ම මෙම සාමුහිකත්වය අනතුරට හෙළන්නේය.
* "එකම සභාවක් ගොඩ නගන ක්‍රිස්තුන් වහන්සේගේ සියලු විශ්වාසකයින්ගේ, එනම් මෙලොවෙහි ආගන්තුක සංචාරක සභාවේ සාමාජියයන්ගේද, (සටන් කරන සභාව) / ශුද්ධිකාගිනිස්ථානයෙහි පවිත්‍ර කරනු ලබන මළවුන්ගේ ද (දුක්විඳින සභාව) / ස්වර්ගීය භාග්‍යවතුන්ගේ ද (ජයලත් සභාව) / සාමුහිකත්වය කෙරෙහි අපි විශ්වාස කරමු. තවද මෙම සාමුහිකත්වය හේතුවෙන්, දෙවියන් වහන්සේගේ ද ඔවුන් වහන්සේගේ ශුද්ධවන්තයන්ගේ ද දයා කරුණාව අපගේ කන්නලව්ව වෙත යොමු වන බව ද අපි විශ්වාස කරමු. "
( කතෝලික සභා ධර්මෝපදේශය 256 හා 259 පිටු)

05. අප දෙසට : (කුඩා සංඝ ලෙස සාංඝික කර ගනිමු)

* අප සමඟ ජීවත්ව සිට මේවන විට සග සැපත් ව සිටින අය වෙනුවෙන් අපට කළ හැකි දේවල් මොනවාද? (ඔවුන් වෙනුවෙන් අයැදීම, මැදිහත් වීම, ඔවුන් සිහිකර දානය දීම, දිව්‍ය පූජා යාගයන් තුළ නිල යැදුම තුළ සිහිකර යාච්ඤා කිරීම)

* "අපට ලැබී ඇති කැඳවීම මරණෙන් පසු ස්වර්ගයට යෑම පමණක් නොව මෙලොවේ දීම දේව රාජ්‍ය තුළ දිවි ගෙවීමට ඇති කැඳවීමය" මේ පිළිබඳව ඔබට අවදි වීමක් තිබෙනවාද? සාකච්ඡා කරන්න.

* එවන් ස්වර්ගීය දිවියක් ගත කරන පුද්ගලයෙකු තුළින්, පවුලක් තුළින්, සංඝයක් තුළින් ප්‍රකාශ විය යුතු ලක්‍ෂණ මොනවාද?

06. අවසන් ප්‍රශංසාව :

**" ලෝකය මත යහපත් දේ කරමින් මාගේ ස්වර්ගීය ජීවිතය ගෙවන්නට මට අවශ්‍යය"** (ලිසියේ සා.තෙරේසා තුමිය) /

**"නොහඬන්න, මක්නිසාදයත්, මාගේ මරණින් පසු මා බොහෝ සේ ඔබට ප්‍රයෝජනවත් වනු ඇත. තවද, මාගේ ජීවිත කාලයට වඩා බොහෝ බලගතු ලෙස එවිට මම ඔබට සහය වෙමි."** (සා. දොමිනික් තුමා)
මෙම යාච්ඤාවන් වලට භාවනාත්මකව ඇතුළු වෙමු. අයිතිකර ගනිමු.

පුබුදු ගී අංක 201 "මරණාථානනි මරණාථානෙනි...."

=====================

## ප්‍රශංසා එකතු සුපුවත

**2018 නොවැම්බර් මස 12 වන දින සිට නොවැම්බර් මස 18 වන දින දක්වා**
**'දන්දීම තුළින් දෙවිඳුන් අත්දැකිය හැකිය'**

01. ආරම්භක ප්‍රශංසාව :
පුබුදු ගී අංක 05 "ඥාන වීර්ය..."

02. ප්‍රශංසාවට හැඳින්වීම :
**"ප්‍රේමයෙන් උන්වහන්සේ ඉදිරියෙහි ශුද්ධව, නොකැළැල්ව සිටින පිණිස, ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ අප තෝරා ගෙන ඇත."**..... (එපීස 1:4-6)
දේව වරප්‍රසාදයෙන් පූර්ණව ශුද්ධව, නොකැළැල්ව මෙලොව දිවි ගෙවන්නට අප තෝරා ගත් දෙවි මහෝත්තමයාණන් හට ප්‍රශංසාවෙන්, නමස්කාරයෙන් යුතුව තුති පුදමු. අප දරුකමට පිළිගන්නට පෙර නියම කළ ඔවුන් වහන්සේ සදාතනික උරුමය අපට හිමි කර දී තිබේ. මළවුන්, මරණය සිහි කරන්නට වඩාත් යොමුවන මෙම මාසය පුරා ඔබේ මගේ ජීවිතයේ මරණයට, සදාතනික උරුමය හිමිකර ගන්නට අප කොතෙක් සූදානම් ද? අවදි වෙමින් ප්‍රශංසා කරමු. දෙවිඳුන් සදාතනික ජීවිතය තුළ දැකීමේ පිපාසය මෙන්ම මෙලොව ගත කරන ජීවිතයේ නිතර නිතර දෙවිඳුන් හමුවෙමින් ඔවුන් වහන්සේ පසසමු.
පුබුදු ගී අංක 42 "අහස පොළොව ......"

03. පසුගිය සතියේ අත්දැකීම ළඟ සිටින කෙනෙකු සමඟ බෙදා ගන්න.

04. දවසේ සුපුවත : තෝබිත් 4:7-11, 12:8-9
* ඔබ සවන් දුන් ශුද්ධ ලියවිලි පාඨ දෙක හරහා ඔබට බලපෑ වචනය, ඉන් ඉඟි කරන අත්දැකීම ළඟ සිටින දෙදෙනෙකු සමඟ බෙදා ගන්න.

වචනයේ සේවකයා සඳහා :
* අප සවන් දුන් ශුද්ධ ලියවිලි පාඨ දෙක තුළින්ම දානය නැතහොත් දන්දීම පිළිබඳ අවදි කිරීමක් ඉදිරිපත් කරයි.
* දන් දිය යුත්තේ කෙසේද? ඉන් ලැබෙන ප්‍රතිඵලය කුමක් ද? දන් දීම දෙවිඳුන් තුළට අප යොමු කරන අයුරු ද තෝබිත් පොත ඉතා පැහැදිලිව ඉදිරිපත් කරයි.
* දන් දිය යුත්තේ මසුරු කමින් තොරවය. එසේම දිළිඳුන් හට දන් දීමෙන් දෙවිඳුන් දැකිය හැකිය. ("කිසි දිළින්දෙකුගෙන් නුඹ මුහුණ අහකට හරවා නොගන්න. එවිට දෙවියන් වහන්සේ ද නුඹෙන් සිය මුහුණ අහකට හරවා නොගන්න සේක.")
* දන්දීම යහපත් ක්‍රියාවකි. දන්දීම මරණින් මුදයි. මිනිසුන් අන්ධකාරයට බැස යාමෙන් ගළවයි. එසේම විවිධාකාර පාපයන්ගෙන් පවිත්‍ර කරයි.

* බොහෝ දෑ රැස් කිරීම, දුෂ්ඨ කමින් කල් ගෙවීම වෙනුවට උපවාසයෙන්, යාච්ඤාවෙන් දන් දීමෙන් ජීවත් වීම තුළ සදාතනික ජීවිතය කරා ළඟා විය හැකිය.

05. අප දෙසට : (බෙදා ගන්න)

**i** ඔබ සතු දෙයින් යමක් තව කෙනෙකුට දීම සඳහා ඔබ කැමැත්තක් දක්වන්නේද? දන්දීමට ඔබේ යොමුව කොතෙක්ද?

**ii** දීමට වඩා රැස් කිරීමට ඔබ පෙළඹෙන්නෙක් ද? මසුරුකම නමැති පාපය පිළිබඳ ඔබ අවදියෙන්ද?

06. ප්‍රායෝගිකව :

**i** දන්දීම ගැළවීමේ මඟක් ලෙස අත්දකින්නට අවදි වෙමු. ඒ මන්දයත් දන්දීම මරණින් මුදයි. විවිධාකාර පාපයන්ගෙන් පවිත්‍ර කරයි. දුෂ්ඨකමින් හැරෙන්නට මඟ දක්වයි.

**ii** මළවුන් වෙනුවෙන් දන් දෙන මෙම කාලය තුළ නොමසුරුව, දිළිඳුන් සඳහා යමක් දෙන්නට පියවර ගනිමු.

07. අවසාන ප්‍රශංසාව :

පුබුදු ගී අංක 314 "ඔබගේ කැමැත්ත ....."

=========================

## ප්‍රශංසා එකතු සුපුවත

**2018 නොවැම්බර් මස 19 වන දින සිට නොවැම්බර් මස 25 වන දින දක්වා**

**ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත දානය මගින් මෙලොව ස්ථාපිත වූ දේව රාජ්‍ය**

01. ප්‍රශංසාව සඳහා :

* **"මා පියාණන් මට ප්‍රේම කරන්නේ, මා නැවත ලබන පිණිස මාගේ දිවි පුදන බැවිනි"** (ශු.ජොහාන් 10:17).

* ජීවිත දානය යනු ක්‍රිස්තුන් වහන්සේ කුරුසිය මත සිදුකල ජීවිත පූජාවයි. ජීවිත දානය ප්‍රේමයේ පදනමයි. එය ශ්‍රේෂ්ඨවූ ද, උත්කෘෂ්ඨවූ ද අසීමිත වූ ප්‍රේමයේ ක්‍රියාවකි. පියාණන් වහන්සේව මහිමයට පත් කරන ලද අතී ගෞරාන්විත ක්‍රියාවයි. එහෙයින් ජේසුස් වහන්සේගේ ජීවිත දානයේ (ජීවිත පූජාවේ ) ඵලය වූයේ මුළු මිනිස් සංහතියටම ගැළවීම උදා කරමින් දේව රාජ්‍යය මෙලොව ස්ථාපිත කිරීමයි.

* නැතිවූ උරුමය යලි අපට උරුම කර දීමට අප උදෙසා දිවි පිදූ සමිඳාණන්ට අපගේ නමස්කාරය තුති පැසසුම් පුද කරමු.

* පුබුදු ගී 221 "ජේසුනී සමිඳේ ....// ජේසුනි ඔබ නාමයෙනි අප විමුක්තිය දුටුවේ..... "

02. පසුගිය සතියේ අත්දැකීම් බෙදා ගනිමින් නැවත මොහොතක් ඔවුන් වහන්සේට ප්‍රශංසා කරන්න.

03. සතියේ සුපුවත : (පහත දැක්වෙන ශුද්ධ ලියවිලි පාඨ කියවා පියාණන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත පුත්‍රයාණන්ගේ ජීවිත පූජාව හා එමගින් සිදුවූ දේව රාජ්‍යයේ උදාවීම පිළිබඳව කුඩා කණ්ඩායම් තුළ බෙදා ගනිමු.)

i යෙසායා 53:10 **"එහෙත් එතුමන් පෙළනු ලැබුවේත්, දුකට පත් කරනු ලැබුවේත් සමිඳාණන්ගේ කැමැත්ත ලෙස ය. මෙසේ එතුමන්ගේ මරණය පව් කමා කරන පූජාවක් වේ."**

ii ශු.ජොහාන් 10:17-18 **"මා පියාණන් මට ප්‍රේම කරන්නේ, මා නැවත ලබන පිණිස මාගේ දිවි පුදන බැවිනි. කිසිවෙක් එය මගෙන් පැහැර නොගනිති.... එය පුදන්නට මට බලය තිබේ. එය යළි ලබන්නට ද මට බලය තිබේ......"**

iii ශු.මාක් 10:45 **"මනුෂ්‍ය පුත්‍රයාණන් වුවද වැඩියේ, සේවය ලැබීමට නොව සේවය කිරීමට ය; බොහෝ උදෙසා මිදීමේ මිලයක් වී, සිය දිවි පිදීමට ය."**

04. වචනයේ සේවකයා සඳහා :

i යෙසායා දිවැසිවරයාගේ ග්‍රන්ථයේ සඳහන් පරිදි ක්‍රිස්තුන් වහන්සේ තම පියාණන් ඉදිරියේ දුක් විඳින සේවකයාණන් බවට පත් වෙමින්, මේ දුක දරා ගත්තේ කෙසේදැයි මෙනෙහි කරද්දී ඔවුන් වහන්සේ දේව පුත්‍රයාණන් නිසා විශේෂ ශක්තියක්, ධෛර්යක් තිබුනේ යයි කෙනෙකු සිතන්නට පුළුවන. එසේ නම් මල් උයනේදී, දුක් ශෝකයෙන් පීඩිතවූ මොහොතේ සැබෑ මනුෂ්‍ය පුතෙකු ලෙස ඒ කුසලාන ඉවත් කරන්නට ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළ අයුරු අපි දකිමු. සත්‍ය වශයෙන්ම සියල්ල දරා ගෙන ප්‍රේමයෙන් හා ඇතුලාන්ත නිදහසකින් තාත්තාගේ කැමැත්ත ඉටු කරන්නට හැකිවූයේ සකල මනුෂ්‍ය වර්ගයා කෙරෙහි වූ ප්‍රේමය නිසයි. මෙසේ දේව සැලැස්ම අනුව ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත දානය (ජීවිත පූජාව) මගින් ලොවට දේව රාජ්‍යය උදා විය. ඔවුන් වහන්සේගේ උත්ථානය මගින් අප අතර දේව රාජ්‍යය ස්ථාපිත විය. රාජ්‍යය ඇවිත්.....

ii ක්‍රිස්තුන් වහන්සේගේ මරණය අහඹු සිදුවීමක් නොවේ. මනුෂ්‍ය දෙනෙතට හා සිතට පෙනෙන, දැනෙන අයුරු අකල් මරණයක් නොවේ. මරණයේ තීන්දුව මනුෂ්‍ය තීරණයක් ද නොවෙයි.
* මා පියාණන් මට ප්‍රේම කරන්නේ මා නැවත ලබන පිණිස මාගේ දිවි පුදන බැවිනි.
* පිලාත් ආණ්ඩුකාරයා ජේසුස් වහන්සේව නිදහස් කරන්නට වෑයම් කරද්දී ක්‍රිස්තුන් වහන්සේගේ පිළිතුර වූයේ, 'දෙවිඳුන් විසින් බලය නොදෙන ලද්දේ නම් මට විරුද්ධව ඔබට බලයක් නැත.'
* එය පුදන්නට මට බලය තිබේ. යළි ලබන්නට ද බලය තිබේ...
* ජේසුස් වහන්සේගේ මරණය හා උත්ථානය අපගේ උත්ථානයට ගැඹුරු සාක්ෂියකි. එනම් පැවතුනු තත්ත්වය පහවී, ඉතිහාසය දෙබෑ කරමින්, මුළු විශ්වයම අළුත් උපතක් ලැබූ බවයි. මතු දිනක සියල්ල පරිපූර්ණත්වය පත්වන බවයි.

iii බොහෝ දෙනා උදෙසා මිදීමේ මිලයක් වී, සියදිවි පිදීමට ය.

05 අප දෙසටː (බෙදා ගන්න)

* ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත දානය ප්‍රේමයේ පදනමයි. එය ශ්‍රේෂ්ඨවූ ද අති උත්කෘෂ්ඨවූ ද ප්‍රේමයේ ක්‍රියාවකි. මා අනුව එන්න යැයි කැඳවීම ලැබූ අපි ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත දානයට සාක්ෂි දරන්නන් වී සිටිද?

* ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත දානය මනස්ථාපනය හා දේව රාජ්‍යය අතර ඇති ගැඹුරු සම්බන්ධතාවයක් අත්දකින්නට අපව කැඳවයි. ඒ සඳහා ඔබේ අවදිවීම කෙසේද?

05. අවසාන යැදුම : පුබුදු ගී අංක 24 "සැමට පළමු දෙව් රජය සොයව්...."

====================

## ප්‍රශංසා එකතු සුපුවත

**2018 නොවැම්බර් මස 26 වන දින සිට දෙසැම්බර් මස 01 වන දින දක්වා**

**දේව රාජ්‍යය සඳහා අපගේ ජීවිත දානය කරමු**

01. ප්‍රශංසාව සඳහා යොමුව :
* ගැළවීම යනුවෙන් අදහස් කරන්නේ පාපායේ විපාකයෙන් මනුෂ්‍යයන් මුදා ගැනීම පිණිස ක්‍රිස්තුන් වහන්නසේ තම දුක් වේදනා හා මරණයද වන්දියක් කොට දෙව් පියාණන්ට පිදීමය. සත්‍යයත් යුක්තියත් සඳහා අසම සම දුක් ගැහැට විද මරණින් උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ අපට පෙන්වා දුන්නේ ඔවුන් වහන්සේගේ ජීවිත දානය මඟින් මිනිසාට ගැළවීම අත්පත් කර දීම දේව සැළසුම බවයි.
* මාගේ නාමයෙන් දෙව් රජය රජ කරවන්නට මා අනුව එන්නැ'යි සමිදාණෝ බෞතිස්ම ස්නාපනය නැමති ශුද්ධවූ සක්‍රමේන්තුව මඟින් අපට ආරාධනය කරන සේක. එයින් දෙවියන් වහන්සේගේ අභිප්‍රාය උදෙසා මෙසේ රාජ්‍ය සඳහා කැපවෙන්නට වැයවෙන්නට ජීවිත දානය කරන්නට වරම්ලත් අපි මේ මොහොතේ ඔවුන් වහන්සේට ස්තූති ප්‍රශංසා කරමු.
* පුබුදු ගී 24 " සැමට පළමු දෙව් රජය සොයව්...."

02. සතියේ සුපුවත ( පහත සඳහන් ශු.ලියවිලි පාඨ කියවා අප ලබා ඇති භාරදූර කාර්යය පිළිබඳව බෙදා ගනිමු)

* ශු. මාක් 4:19 **"මා අනුව එන්න මම ඔබ මිනිසුන් දිනන්නන් කරමි........"**
* ශු. මතෙව් 10:6 **"ඉශ්‍රායෙල් වංශයේ නැතිවූ බැටළුවන් වෙතට යන්න......"**
* ශු. මාක් 16:24-25 **"යමෙක් මා අනුව එන්නට කැමැත්තේද ඔහු තම කම නසමින් කුරුසිය දරමින් මා අනුව ඒවා. මන්ද සිය දිවි රැකගන්නට කැමති තැනැත්තේ එය නැති කරගන්නේය. මා උදෙසා සිය දිවි නැති කරගන්නා එය රැකගන්නේය."**

03. වචනයේ සේවකයා සඳහා -

(අ) ජේසුස් වහන්සේගේ සෑම සුසුමක්ම දේව රාජ්‍ය සඳහාය. ඔවුන් වහන්සේ අපට ඉගැන්වූ යාච්ඤාව මගින් පවා ( ඔබගේ රාජ්‍ය පැමිණේවා) අපව අවදි කරනු ලබන්නේද කැඳවනු ලබන්නේද රාජ්‍ය සඳහා ජීවිතය දෙන පිණිසය. එනම් කාලය ශ්‍රමය මෙන්ම අප සතු සියල්ල වැය කරමින් රාජ්‍ය සඳහා ජීවිත දානය කිරීම දෙවි පියාණන්ගේ කැමැත්ත යි.

(ආ) කුරුසිය දරා මා අනුව එන්න..... අපගේ සුපුරුදු හුරු පුරුදු ජීවිතය අත් හැර ඔවුන් වහන්සේ කියන පිළිවෙළට ජීවත් වෙන්නට අපව කැඳවන සේක. අපව කැඳවන්නේ අප ගත කරන ජීවිතය රැකගන්නට නොවේ. ක්‍රිස්තුස් වහන්සේ කරුණාකොට ගෙන ඇණ ගැසෙන්නටය. එනම්, ජීවිතය නැති කරගන්නටය. රාජ්‍ය උදෙසා ජීවිතය වැය කරන්නටය. එවිට ආත්මයාණන් වහන්සේ කරුණා කොටගෙන මිනිස් හදවත තුළ, පවුල තුළ, සංඝය තුළ, සමාජය තුළ දේව රාජ්‍ය බිහි වනු ඇත. රාජ්‍ය ප්‍රකාශ වනු ඇත.

(ඇ) ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත ආකල්පය රාජ්‍ය පිලිබදව දැක්ම මෙසේ මිනිස් පරිසරයන් තුළ එනම් පවුල තුළ, සංඝය හා සමාජය තුළ ආරෝපණය කිරීම අප සතු වගකීමයි, කාර්ය භාර්යයයි. දේව රාජ්‍ය ක්‍රිස්තුස් වහන්සේය. එබැවින් අප අතර ඔවුන් වහන්සේව ජීවමාන කිරීමයි.

(ඈ) "සිතින් දිලින්දෝ භාග්‍යවන්ගයෝය. යුක්තියට සා පිපාස ඇත්තෝ භාග්‍යවන්තයෝය. යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය......ප්‍රීති ප්‍රමෝද වන්න මන්ද, ස්වර්ග රාජ්‍යයේ ඔබේ ඵල විපාක මහත්ය." ශුද්ධ ලියවිල්ල මෙසේ අපව දැනුවත් කරනු ලබයි. එසේම දිලිඳු කම හා දේව රාජ්‍ය අතර, සාංඝික ජීවිතය හා දේව රාජ්‍ය අතර ගැඹුරු සම්බන්ධකමක් තිබෙන බවද ශුද්ධ ලියවිල්ල අපට සාක්ෂි දරයි. එහෙයින් එකමුතුකමේ ජීවිතය මිනිස් සමාජයටම ඉමහත් අභියෝගයක් වන අතර එවිට අපට මුහුන දෙන්නට සිදුවන ශාරීරික මානසික පීඩාවන් හා වේදනාවන් සියල්ල ඉත සිසින් දරා ගැනීමද ජීවිත දානයකි. තමන්ගේද අන් අයගේද ගැළවීම උදෙසා අත්හැරීමද ජීවිතය පුජා කිරීමකි. කැප කිරීමකි.

(ඉ) ස්වර්ගීය උරුමය ලබා ගන්නා මාර්ගය ක්‍රිස්තුස් වහන්සේ තමන් වහන්සේගේ මුළු ජීවිත කාලය තුළම මිනිසුන්ට කියා දුන්සේක. එපමණක් නොව තම වචනයෙන් ද ක්‍රියාවෙන් ද ආදර්ශයක් දෙමින් ප්‍රාතිහාර්යන් මගින් එය සනාථ කළ සේක. එවකට පැවති දේශපාලන බලය උසස් නිල තනතුරු ද ධනවාදය යනාදි සියල්ල ප්‍රතික්ෂේප කරමින් සේවය ලැබීමට නොව සේවය කිරීම එතුමාණන්ගේ අරමුණ විය.

04. අප දෙසට : (බෙදා ගන්න)

* ක්‍රිස්තුස් වහන්සේගේ දූත සේවාව වනාහි පාස්කු අභිරහස දක්වා ජීවිත ගමනකි. දේව දරුවන් වන අපගේ ජීවිත ගමන මෙයයි. ඒ සඳහා අපගේ ප්‍රතිචාරය කෙසේද?
* මෙසේ කුරුසිය දරාගෙන විශ්වාසයේ ගමනක යෙදෙන්නට අවැසි ශද්ධාත්ම වරම් පතා යාච්ඤා කරමින් විශ්වාසයේ පියවරයන් ගන්නේ කෙසේදැයි බෙදා ගන්න.

* පුබුදු ගී අංක 24 "සැමට පළමු දෙවි රජය සොයව්...."

******************